තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව - 2021

-------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල සාධාරණ අගය ප්‍රමාණාත්මකව වෙනස්වීම මත ප්‍රත්‍යාගණනයන් සිදුකල යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පිරිවැය රු.127,468,319 ක වත්කම් 2008 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | මෙම වත්කම් ප්‍රත්‍යාගණනයට අදාළ සියලු විස්තර තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පරිදි ප්‍රත්‍යාගණනයන් සිදුකල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිත්‍යාග වශයෙන් 2014 වර්ෂයේදී බාහිර ආයතනයක් වෙත ලබාදී තිබුණු පිරිවැය රු.5,760,324 ක් වූ වත්කම් 2020 වර්ෂයේදී පොත්වලින් ඉවත් කර තිබුණද එම වත්කම් වලට අදාල රු.1,881,720 ක් වූ සමුච්චිත ක්ෂය වෙන් කිරීම පොත් වලින් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි. මෙම නිසා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සමුච්චිත ක්ෂය වෙන්කිරීම ඉහත අගයෙන් වැඩියෙන් දැක්වුණි. | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ඉවත් කල වත්කම් වෙනුවෙන් වෙන් කරන ලද ක්ෂය අගය 2022 වසරෙහි ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරන ලෙස උපදෙස් දෙන ලදි. | ඉදිරි වර්ෂයේදී ගිණුම් පිළියෙල කිරිමේදී නිවැරදි කළ යුතු අතර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.1,879,170 ක් වූ හඳුනා නොගත් අත්තිකාරම් ශේෂයට අදාල විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2017 වසරේ සිදු වූ ගිණුම්කරණ පද්ධතිය අක්‍රිය වීම හේතුවෙන් එම අගයන් ද්විගණනය වීම මඟින් මෙම වෙනස උද්ගත වී ඇත. එයට අදාළ විස්තර විගණනය වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් දී ඇත. | අදාල උපලේඛන විගණනයට ලබා දීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී සමුච්චිත අරමුදලට ආරම්භක ශේෂ ගැළපීම් ලෙස එකතුව රු.1,524,941 ක් බැර කර තිබුණද ඊට අදාළ ජ'නල් සටහන් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | මෙහිදි වත්කම් නැවත ගිණුම්ගත කිරිමේදී ඒ වෙනුවෙන් වෙන් කරන ලද ක්ෂය අගයන්ද ගැලපුම් කළ යුතු බැවින් අදාල ගැලපුම් සටහන් පරිවර්තිත සංචිත ගිණුම මගින් යොදන ලදී. | අදාළ ගැලපුම් සඳහා ජර්නල් සටහන් ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | වර්ෂයට අදාල ක්ෂය ගණනය කිරීමේදී වත්කම් අයිතම 03කට අදාල ක්ෂය වියදම රු.554,518ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම නිසා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | විගණනයෙන් සඳහන් කර ඇති වත්කම් 03ට අදාලව වැඩියෙන් ගණනය වූ ක්ෂය අගයන් නිවැරදි කරන ලෙස උපදෙස් දී ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී වර්ෂයට අදාල ක්ෂය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කල යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ 2017 වර්ෂයේ සිට ලැබිය යුතු ශේෂ ලෙස ඇතුලත් රු. 740,609 ක් 2021 දෙසැම්බර් 31 දක්වාම අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා ඇති ලැබිය යුතු ශේෂ අගයන් නිරවුල් කරන ලෙස උපදෙස් දී ඇත. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ 2017 වර්ෂයේ සිට ගෙවිය යුතු ශේෂ ලෙස ඇතුලත් එකතුව රු.1,880,445 ක් 2021 දෙසැම්බර් 31 දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා ඇති ගෙවිය යුතු අගයන් නිරවුල් කරන ලෙස උපදෙස් දී ඇත. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ නිලධාරීන් 73 දෙනෙකු වෙත 2017 වර්ෂයේදී ලබාදී තිබුණු එකතුව රු. 3,538,215 ක අත්තිකාරම් මුදල් හා Sector Council 02 ක් වෙත 2019 වර්ෂයේදී ලබාදී තිබුණු එකතුව රු. 7,640,807 ක අත්තිකාරම් 2021 දෙසැම්බර් 31 දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් ගිණුම පරික්ෂාකර බලා නිරවුල් කිරීමට පියවර ගන්නා ලෙස උපදෙස් දී ඇත. | ලබාගත් අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 396 (ඇ) වගන්තිය | නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ කාලය මාස 06 ඉක්මවූ එකතුව රු. 1,690,526 ක් වූ චෙක්පත් 228ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිකුත් කල නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොකළ චෙක්පත්වල අගයන් හඳුනාගෙන 2022 අප්‍රේල් බැංකු සැසඳුම මඟින් නැවත ගිණුම්ගත කිරීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 1646 | යොමුගත රෙගුලාසි ප්‍රකාරව දෛනික ධාවන සටහන් සෑම මාසයක් අවසාන වී දින 15 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් කොමිෂන් සභාවේ සංචිත වාහන 12 ක් සම්බන්ධයෙන් අදාල රෙගුලාසි ප්‍රකාරව ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371 (ආ) රෙගුලාසිය | යම් විශේෂිත කාර්යයක් සඳහා එක් අවස්ථාවකදී රු. 100,000 ක උපරිමයක් දක්වා පමණක් අතුරු අග්‍රිම ලබාදිය හැකි වුවත් ඊට පටහැනි ලෙස අවස්ථා 03 කදී රු. 3,337,874 ක සිට රු. 4,911,560 ක් දක්වා අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | මෙසේ අතුරු අග්‍රිම නිකුත් කිරීමට සිදුවූයේ දිවයින පුරා පවත්වන ලද ජාතික වෘත්තීය සුදුසුකම් විභාගය පැවැත්වීම වෙනුවෙනි. එසේ වුවද මෙම වසරේ සිට අතුරු අග්‍රිම සීමාව රු.100,000 සීමා කිරීමට වැඩපිළිවෙළක් යොදා ඒ අනුව සීමාකර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2017 ඔක්තෝබර් 25 දිනැති අංක 05/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | දැනට ලබන වැටුපට අතිරේකව චක්‍රලේඛයෙන් අනුමත දීමනාවන් හැර වෙනත් කිසිදු විශේෂ දීමනාවක් නොලබන නිලධරයන් සඳහා පමණක් 2017 ඔක්තෝබර් 01 දින සිට වෘත්තීය දීමනාවක් ගෙවිය හැක. ඊට පටහැනිව මූලික වැටුපෙන් 1/3ක දීමනාවක් ලබා ගන්නා කොමිෂන් සභාවේ නිලධාරීන් 9 දෙනෙකු වෙත 2018 ජනවාරි | අදාළ නිළධාරීන්ගේ සාමාන්‍ය රාජකාරියෙන් බැහැරව එම ව්‍යාපෘතිය සමඟ එළඹී ද්විපාර්ශවික ගිවිසුමකට අනුව එකඟ වූ කාර්යයක් ඉටු කිරීම වෙනුවෙන් මෙම දීමනාව ගෙවා ඇත. මෙහිදී එක් එක් නිළධාරියා විසින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් කරනු ලැබූ කාර්යයන් අගැයීමක් කිරීමෙන් අනතුරුව පමණක් මෙම | කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව දීමනා දෙකක් ගෙවිය නොහැකි බැවින් වැඩිපුර ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | මාසයේ සිට 2021 දෙසැම්බර් මාසය දක්වා ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියේ රාජකාරි කිරීම වෙනුවෙන්, එකතුව රු. 2,655,000 ක වෘත්තීය දීමනා ගෙවා තිබුණි. | දීමනාව ගෙවනු ලබන අතර, එසේ ඉටුකරනු ලැබූ කාර්යයන් පිළිබඳ සෑහීමකට පත් නොවේනම් එම දීමනාව හිමිනොවන බව සඳහන් කරමි. | |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/ 2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රජයේ වාහන සම්බන්ධයෙන් සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක් හෝ කිලෝමීටර් 25,000 ක් දුර ප්‍රමාණයක් ධාවනයෙන් පසුව අනිවාර්යයයෙන්ම ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කලයුතු වුවත් කොමිෂන් සභාවේ භාවිතා කරනු ලබන වාහන 12 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | චක්‍රලේඛයේ උපදෙස් වලට අනුකූලව ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,548,803 ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 22,164,883 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 25,713,686 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ව්‍යාපෘති ප්‍රදාන අඩුවීම හා ජාතික නිපුණතා සහතික සඳහා විභාග පිරිවැය වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | (i) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ බලතල ප්‍රකාරව, කොමිෂන් සභාව විසින් නිකුත් කර තිබුණු ඇගයීම්කරුවන්ගේ ආචාරධර්මවලට පටහැනිව පෞද්ගලික ආයතනයක ආධුනිකයන්ගේ ඇගයීම් කටයුතු කොමිෂන් සභාවේ ඇගයීම් කරුවන් විසින් සිදුකර තිබුණි. | අදාළ ඇගයීමට සම්බන්ධ ඇගයුම් කරුවන්ගේ ඇගයීම් කටයුතු මේ වන විටත් තාවකාලිකව අත්හිටුවා ඇත. අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලද නිලධාරී කමිටුවක් මගින් 2022.05.05 වන දින මූලික විමර්ශන කටයුතු සිදු කරන ලද අතර එහි වාර්තාව ලැබීමට නියමිත ය. | පනතේ බලතල ප්‍රකාරව කොමිෂන් සභාව විසින් නිකුත් කර තිබුණු ආචාරධර්මවලට අනුකූලව ඇගයීම් කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | එම කමිටු වාර්තාව අනුව ඉදිරියේදී අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලබයි. | |
| (ii) | කොමිෂන් සභාවට ලැබී ඇති බලතල අනුව ආයතන ලියාපදිංචිය, පාඨමාලා සඳහා බාහිර පුහුණු කාලය(On the job traning), ආයතන සුපරීක්ෂණය හා සහතික පත්‍ර නිකුත් කිරීම් සම්බන්ධයෙන් හඳුන්වාදී තිබුණු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ගෙන් බැහැර වෙමින් ලියාපදිංචි වී තිබුණු පෞද්ගලික වෘත්තීය පුහුණු ආයතනයක ආධුනිකයන් සඳහා කොමිෂන් සභාවේ සහතික පත්‍ර නිකුත් කර තිබුණි. | ජාතික වෘත්තිය සුදුසුකම් සහතික පත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබන්නේ ශිෂ්‍ය ඇගයීම් වාර්තාව හා ආයතනය මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් පද්ධතියට ඇතුළත් කරන දත්ත සන්සන්දනය කිරීමෙන් අනතුරුව වන බැවින්, එම අවශ්‍යතා දෙකම සපුරා ඇති බැවින් එම සහතික පත්‍ර දෙක මුද්‍රණය කරන ලදි.<br>නමුත් අදාළ ආයතනය සම්බන්ධව ලැබූ මහජන පැමිණිල්ලක් මත සිදු කරන ලද විමර්ශන කටයුතු නිම වනතුරු අදාළ ආයතනයේ සහතික නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවා ඇති අතර, මෙතෙක් නිකුත් කරන ලද සහතිකපත්‍ර දෙක ද ජාතික වෘත්තීය සුදුසුකම් පද්ධතියෙන් තාවකාලිකව ඉවත් කිරීමට ද කටයුතු කර ඇත. | |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉලක්ක ළඟාකර ගැනීම සඳහා අංශ 08 කින් යුක්තව නිලධාරීන් 89 දෙනෙකුගෙන් යුතුව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපිත කර තිබුණි. එක් එක් අංශයන් අනුව 2021 වර්ෂයට අදාලව සකස් කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව ළඟාකර ගත් ඉලක්ක සැසඳීමේදී අංශ 08 න් අංශ 4 ක ඉලක්ක ළඟාකර ගැනීම සියයට 20 සිට සියයට 60 දක්වා පහල මට්ටමක පැවතුණි. | රටතුල පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් හඳුනාගත් ඉලක්ක වෙත ළඟා වීමට නොහැකි විය. | හඳුනාගත් ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොමිෂන් සභාවේ සහතික පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී 2021 වර්ෂයේදී ඉලක්ක කල සහතික නිකුත් කිරීම් හා සත්‍ය නිකුත් කිරීම් පරීක්ෂා කිරීමේදී ඉලක්ක වෙත ළඟාවීම සියයට 50කට අඩු මට්ටමක පැවතුණු අතර 2017 වර්ෂයේ සිට සහතික පත් නිකුත් කිරීම් සැලකිල්ලට ගත්විට 2021 වර්ෂය වන විට එය සියයට 31 කින් අඩුවීමක් නිරීක්ෂණය විය. | රටතුල පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් හඳුනාගත් ඉලක්ක වෙත ළඟා වීමට නොහැකි විය. | ජාතික මට්ටමේ නිපුණතා සහතික නිකුත් කිරීම කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්විය යුතු අතර සහතික නිකුත් කිරීම කඩිනමින් සිදුකල යුතුය. |
| (ඇ) | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් කොමිෂන් සභාවේ තොරතුරු පද්ධතියෙන් ලබාගත් තොරතුරු අනුව ආරම්භයේ සිට ලියාපදිංචි කර තිබුණු ආයතන 1,423 න් සියයට 58 ක් වූ ආයතන 820 ක් පමණ 2021 අප්‍රේල් 30 වන විට ලියාපදිංචි කාලය ඉකුත් වී තිබුණද ලියාපදිංචි අලුත් කිරීම සඳහා ඉල්ලුම් කර නොතිබුණි. එසේ වුවද දැනුවත් කිරීම් සිදුකර ආයතනවල ක්‍රියාකාරකම් අලුත් කරවීම සඳහා කටයුතු කර නොතිබුණි. | ලියාපදිංචිය කල් ඉකුත් වී ඇති ආයතනවල ලියාපදිංචිය අළුත් කිරීම සඳහා වෙනම අධ්‍යක්ෂවරයෙකු පත්කර වෙනම වැඩ පිළිවෙලක් සකස් කර ඇත. | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට හා හඳුනාගත් ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කල යුතුය. රටතුල පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතනවල නියාමනයන් නිසි පරිදි සිදුකල යුතුය |
| (ඈ) | ලියාපදිංචි ආයතන 1,423 අතුරින් සක්‍රීය මට්ටමේ පවතින ආයතන 820 ක ප්‍රමාණයක් පමණක් සක්‍රීය මට්ටමේ වෘත්තීය පුහුණු කටයුතු සිදු කරන බවට නිරීක්ෂණය විය. | ආයතනය ආරම්භ කිරීමේ සිට මේ දක්වා ලියාපදිංචි වී ඇති ආයතන අතුරින් බොහෝ ආයතන වසා ඇති බව නිරීක්ෂණය වූ අතර, ඒවා වසා ඇති ආයතන ලෙස නම් කිරීමට කටයුතු කරමින් පවතී. | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට හා හඳුනාගත් ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කල යුතුය. රටතුල පවත්වාගෙන යනු ලබන වෘත්තීය පුහුණු ආයතනවල නියාමනයන් නිසි පරිදි සිදුකල යුතුය. |